# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 මාර්තු/අප්‍රේල්
### සමාජීයවිද්‍යා පීඨය
### ආර්ථික විද්‍යාව - ECON E 1015

### ආර්ථික විද්‍යාවේ මූලධර්ම

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

1. (අ) 'සෑම ආර්ථික පද්ධතියකම හිඟකම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දේ' යන්නෙන් කවරක් අදහස් වන්නේද ? (ලකුණු 08)

   (ආ) ආර්ථික පද්ධතියක ප්‍රධාන කාර්යයන් කවරේද? (ලකුණු 06)

   (ඉ) ආර්ථික විද්‍යාඥයන් ආර්ථික සම්පතක් යන්නෙන් අදහස් කරනුයේ කුමක්ද? (ලකුණු06)

2. (අ) ඉල්ලුම් නීතිය මගින් ප්‍රකාශ වන්නේ කුමක්ද ? (ලකුණු 07)

   (ආ) නොමිල භාණ්ඩයක දක්නට ලැබෙනුයේ කවර ලක්ෂණයන් ද? (ලකුණු 05)

   (ඉ) උපරිම මිලක් නිසා කිසියම් භාණ්ඩයක් සඳහා අධි ඉල්ලුමක් ඇති වන්නේ ඇයි?රූපසටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න . (ලකුණු 08)

3. තරගකාරී වෙළඳපොලක අලෙවි කෙරෙන භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණ මගින් නිරූපනය කෙරේ.

   $Qd = 100\text{-}2P$ සහ $Qs = \text{-}30+3P$

   (අ) මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න.

   (ආ) වෙළඳපොල සමතුලිතයේදී මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න.

   (ඉ) මෙම භාණ්ඩයේ නිෂ්පාදකයා වෙත ඒකකයකට රුපියල් 5 බැගින් වන සහනාධාරයක් ලබා දීමට රජය තීරණය කර ඇතැයි සිතන්න. සහනාධාරය ලබාදුන් පසුව මෙම භාණ්ඩයේ වෙළඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

   (ඊ) සහනාධාරයට පෙර සහ පසු ආර්ථික අතිරික්තය සංසන්දනය කරන්න.

   (උ) සහනාධාරය හඳුන්වා දුන් පසුව මෙම වෙළඳපොලෙහි සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පිළිබඳ ඔබට නිගමනය කළ හැක්කේ කුමක් ද?

   (එක් කොටසකට ලකුණු 04 බැගින්)

4. (අ) කෙටි කාලීන හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිත අතර වෙනස දක්වන්න.

   (ආ) ආර්ථික පිරිමැසුම් හා ආර්ථික නොපිරිමැසුම් හට ගැනීමට හේතු මොනවාද?

(ඉ) ආර්ථික බද්දකුලිය යනු කුමක්ද?නිෂ්පාදන සාධකයකට ආර්ථික බද්දකුලියක් උපයාගත හැකි වනුයේ කවර තත්ත්වයක් යටතේ ද?

(ඊ) හීනවන ආන්තික ඵල සහ හීනවන පරිමාණානුකූල ඵල ආයතනයක නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න

(එක් කොටසකට ලකුණු 05 බැගින්)

5. (අ) පිරිවැය වක්‍ර කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් සලකා බැලීමේදී ස්ථිතික සහ ගතික විශ්ලේෂණ යටතේ දක්නට ලැබෙන මූලික වෙනස්කම් කවරේද? (ලකුණු 06)

(ආ) තරගකාරී වෙළඳපොලක ඉල්ලුම් ශ්‍රිතය Qd =180-2P සමීකරණයෙන් ද සැපයුම් ශ්‍රිතය Qs=-15+P සමීකරණයෙන් ද දැක්වේ. මෙම වෙළඳපොලෙහි භාණ්ඩ ඒකකයක් රුපියල් 72ක් ලෙස අවම මිලක් නියම කරනු ලැබුවහොත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් අහිමි කෙරෙන සුබසාධනයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 06)

(ඉ) පූර්ණතරගකාරී කර්මාන්තයක ආයතනවල දිගු කාලීන සැපයුම් වක්‍ර මගින් කර්මාන්තයේ දිගු කාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරගන්නේ කෙසේ ද ?යෝග්‍ය රූප සටහන් භාවිත කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

6. පහත යුගල අතර වෙනස පහදන්න. (ලකුණු 05 බැගින්)

(අ) මානව ප්‍රාග්ධනය හා භෞතික ප්‍රාග්ධනය
(ආ) ප්‍රත්‍යක්ෂ පිරිවැය හා ආරෝපිත පිරිවැය
(ඉ) මිල තරඟය හා මිල විශේෂණය
(ඊ) ප්‍රාමාණික ලාභ හා අතිප්‍රමාණික ලාභ

7. (අ) 'ඒකාධිකාරී වෙළඳපොල ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම්වීමේ ස්වරූපය එකිනෙකට වෙනස් ප්‍රතිවිපාක මත රඳා පවතී'.සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(ආ) ඒකාධිකාරී වෙළඳපොලක් තුළින් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක මොනවාද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඉ) ඒකාධිකාරයක් තුළින් සමාජ සුබසාධන හානියක් ඇතිවීමට බලපාන සාධක යෝග්‍ය රූපසටහනක් භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 08)

8. (අ) මුදල් ප්‍රමාණවාදය යනු කුමක්ද? (ලකුණු 08)

(ආ) මුදලට ඇති ඉල්ලුමෙහි ප්‍රධාන සංරචක කවරේද? (ලකුණු 04)

(ඉ) දළ දේශීය නිෂ්පාදිතය හා ශුද්ධ ජාතික ආදායම අතර වෙනස පහදන්න. (ලකුණු 08)

9. පහත දැක්වෙන හතරක් 04 පිළිබඳ සටහන් ලියන්න. (ලකුණු 05 බැගින්)

i. ලක්ෂ ඉල්ලුම් නම්‍යතාව
ii. නිෂ්පාදන ඉම
iii. අභ්‍යන්තර පිරිමැසුම්
iv. ද්වි අධිකාරය
v. භාණ්ඩාගාර බැඳුම්කර
vi. මුදලේ සංසරණ ප්‍රවේගය

*********************************